SCHOOL MEDIA CLUBS
National Program to Promote School Media Clubs
Sri - Lanka

**National Program to Promote School Media Clubs**

**Center for Virtual Media and Communiation Study**

**Department of Government Information**

**Ministry of Mass Media**

School Media Club Sri Lanka

Address: 163, Kirulapone Avenue, Colombo 05 Tele: 94112 513 463 E-mail : govinfo.schoolmediaclub@gmail.com

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,

අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු.

# ප්‍රවෘත්ති නිවේදනය

**පාසල් මාධ්‍ය සමාජ ශිෂ්‍ය මාධ්‍යවේදින් සවිබල ගැන්වීමේ විශේෂ වැඩසටහනක් හෙට (18) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී.**

**මානව දයාව පැතිරීමේ අරමුණින් පාසල් මාධ්‍ය සමාජ වෙත සඳුන් පැළ බෙදා දීම සිදු කෙරේ.**

අධ්‍යාපන අමාත්‍යංශයේ උපදෙස් පරිදි, ජනමාධ්‍ය අමාත්‍යංශයේ මූලිකත්වයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මෙහෙයවන පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන යටතේ පාසල් ශිෂ්‍ය මාධ්‍යවේදීන් හඳුනා ගැනීම සහ සවිබල ගන්වමින් වර්තමානයේ පාසල් ප්‍රජාව මුහුණ දෙන සමාජ ගැටලු කළමණාකරණය කිරීමෙහි ලා සන්නිවේදන ඒකකය ලෙස පාසල් මාධ්‍ය සමාජ හරහා පාසල් දරුවන් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි

දශක දෙකකට අධික කාලයක් දිවයිනේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කෙරෙන පාසල් මාධ්‍ය සමාජ වැඩසටහනේ ශිෂ්‍ය ජනමාධ්‍යවේදීන් හඳුනා ගැනීම පුහුණු කිරීම හා දිරිමත් කිරීම උදෙසා ප්‍රථම වරට සංවිධානය කරන මෙම වැඩසටහනේදී වර්තමාන අධ්‍යාපන ක්‍රමයෙහි ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය තුළ සමබර විධිමත් අධ්‍යාපනයක් ලබාදීම සඳහා ඇති කළ යුතු මනෝවිද්‍යාත්මක ප්‍රවේශයන් පාසල් මාධ්‍ය සමාජ හරහා ලබා දීම ඉලක්ක වන අතර ඒ සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව පදනම් කරගෙන ළමුන්ගේ මනස සුවපත් කිරීම සඳහා වැඩසටහන් රාශියක් මෙම නව වැඩපිළිවෙළ යටතේ ක්‍රියාත්මක කෙරේ.

පසුගිය කාල පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ඇතිවූ සිසු ගැටලු වන පාසල් දරුවන්ගේ ආතතිය මානසික පීඩනය ලිංගික අපයෝජන ශාරීරික අඩත්තේට්ටම් කොන් කිරීම හුදෙකලා වීම දඬුවම් වැනි මානසික ආතතීන් සමබර කර යහපත් මානසික සමබරතාවෙන් යුත් පාසල් ප්‍රජාවක් බිහි කිරීම මෙම වැඩසටහනේ මුඛ්‍ය අරමුණ බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

පාසල් මාධ්‍ය සමාජය කේන්ද්‍ර කර ගනිමින් පාසලේ සිදු කෙරෙන අධ්‍යාපන විෂය සමගාමී වැඩසටහන් සඳහා සන්නිවේදන නායකත්වය ලබා දෙමින් අධ්‍යාපනඥයින්, සන්නිවේදන විශේෂඥයින්, මනෝවිද්‍යා උපදේශකයින්, මනෝවිද්‍යා වෛද්‍යවරුන් පාසලට සම්බන්ධ කිරීම සිදු කෙරෙන අතර පාසල් මාධ්‍ය සමාජය විසින් මානව ධර්මතා සන්නිවේදනය කිරීම සඳහා මෙම වැඩසටහන සමග ශිෂ්‍ය මාධ්‍යවේදීන් විසින් නායකත්වය ලබා දීම සිදු කෙරෙන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

2025 ජූලි 18 දින පැවැත්වෙන මෙම නියමු ව්‍යාපෘති වැඩසටහන යටතේ පාසල් දරුවන්ගේ නායකත්වය හැඩගැස්වීම පිළිබඳ විශේෂ දේශනයක් ප්‍රවීණ මාධ්‍යවේදී චන්දන සූරියබණ්ඩාර මහතා විසින් පවත්වනු ලබන අතර අධ්‍යාපන මනෝවිද්‍යාව හා මානසික සමබරතාව පිළිබඳ විශේෂ දේශනයක් කැලණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය අංශයේ අංශාධිපති ආචාර්ය පවිත්‍රා ගොඩමුණේ මහත්මිය විසින් සිදු කරනු ඇත. පාසල් දරුවන්ගේ මානසික ආතතිය සමනය කර ගැනීම හා අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ විශේෂ දෙසුමක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයන අංශයේ මහාචාර්ය ඥානදාස පෙරේරා මහතා විසින් පවත්වනු ලබන අතර මෙම වැඩසටන සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරු මහාචාර්යවරු ඇතුලු විශේෂ පිරිසක් සහභාගී වන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

2025.07.17

**"For a society with holistic media literacy"**